# වනපොත්කරණය හා භාණක සම්ප්‍රදායයෝ

**ආධුනික කථිකාචාර්ය වැලිවිට සොරත හිමි**

## ආරම්භය

''වනපොත්කරණය'' යන වචනයෙහි තේරුම ''කටපාඩම් කිරීම'' යන්නයි.[1] මෙය වර්තමානයේ ඒ සඳහා යොදා ගන්නාවූ වචනය ලෙස හැඳින්විය හැකිය. පැරණි සාහිත්‍ය ඉතිහාසය තුළ පාලි ධර්මය හෙවත් පෙළ දහම (බුදුදහම) කටපාඩමින් පවත්වාගෙන ආ බවට සඳහන් වන වචනය වන්නේ ''මුඛපාළි'' යන්නයි.[2] එනම් එක් කෙනෙක් කියන දේ අසා සිටින තවත් කෙනෙක් ඒ අනුව මතකයේ තබාගෙන මතු පරම්පරාවටත් එය සුරක්ෂිතව පවත්වාගෙන යාමට කටයුතු කිරීමයි. මෙසේ මුඛපරාපරාගතව මතකයේ රඳවාගෙන පැමිණීම පැරණි භාරතයේ සිට පැවතෙන්නකි. එහි ඉතිහාසය වෛදික යුගය දක්වා දිව යයි. මුල් කාලයේ ආගමික ඉගැන්වීම් හෝ උගති පුද්ගලයන් විසින් හදාරණ ලද ධර්ම කොට්ඨාශ මතු පරම්පරාවට දායාද කිරීමේ මූලික වැඩ පිළිවෙලක් හෙවත් ග්‍රන්ථයන්හි ලියා තැබීමක් නොවූ හෙයින් මෙකී ක්‍රමවේදය යොදා ගෙන ඇත. ඒ අනුව තමන් උගත් දේ වෙනත් අයට (තමන්ගේ ගෝලයන්ට) අකුරක් නෑර ඉගැන්වීම සිදු විය. ඔවුන් විසින් පසුකාලීනයන්ට ද එසේම උගන්වමින් පරම්පරාගතව පවත්වාගෙන යාමට කටයුතු සිදු කරන ලදි.

භාරතීය සාහිත්‍යය ගොඩනැගී ඇත්තේ ආගමික හා ලෞකික සාහිත්‍යයක් වශයෙනි. එහි ආරම්භක අවස්ථාව ලෙස වේද ග්‍රන්ථ බිහි වූ කාල වකවානුව පෙන්වා දිය හැකිය. පැරණි කාලයේ භාරතයේ සිටි වෛදිකයෝ ඔවුන්ගේ පරම නිෂ්ඨාව වූ ''බ්‍රහ්ම සහව්‍යතාව' හෙවත් සර්ව බලධාරී බ්‍රහ්මන්ගේ ආත්මය හා ඒකත්වයට පත්වීම හා ලෞකික ජීවිතයේ සියලු ප්‍රාර්ථනා ලබාගනු වස් මහාබ්‍රහ්මයා සතුටු කිරීමට වේද පාඨ ගායනා කරමින් සිදුකළ යාග ක්‍රමවේද බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළ අන්තර්ගත විය. රෝගාබාධ සුවකර ගැනීම, අපල උපද්‍රව දුරුකර ගැනීම, පුත්‍ර සම්පත් ලබා ගැනීම, කෙත්වතු සරුසාර කර ගැනීම ආදි බලාපොරොත්තු ඇතිව වේද පාඨ ලයාන්විතව ගායනා කරමින් යාග පැවැත්වීම සිදුවිය.[3] එසේම දරුවෙක් මව්කුස තුළ පිළිසිඳ ගැනීම, බිහිවීම, රන්කිරි කට ගෑම, උපන් දරුවන්ගේ කෙස් කැපීම, අකුරු කියවීම, ආවාහ විවාහ වැනි වැදගත් මංගල අවස්ථාවන්හි දී ද ඔවුන්ට ආරක්ෂාව හා සෞභාග්‍යය අපේක්ෂාවෙන් යාග හෝම පැවැත්වීම සිදුවිය.[4] මේ සෑම අවස්ථාවකදී ම වේද පාඨ ගායනා කිරීම ද සිදුවිය. ඍග්, යජුර්, සාමන් හා අථර්වන් වශයෙන් හැඳින් වූ එම වේද ග්‍රන්ථ අතරින් මුලින් ත්‍රිවේදය පමණක් ප්‍රාමාණිකත්වයෙන් ගත් බ්‍රාහ්මණ සම්ප්‍රදාය වේද පාඨ මැනවින් ගායනා කරමින් යාග හෝම පැවැත්වූ බව පෙනේ. එම නිසා ම ඔවුන් හැඳින්වූයේ ''ත්‍රිවේද පාර ප්‍රාප්ත'' යන විශේෂිත නාමයෙනි. වේද පාඨ මුලින් ම රචනා කරන ලද්දේ අට්ටක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගි, අංගීරස යනාදි නම්වලින් හැඳින් වූ පැරණි ඍෂිවරුන් පිරිසක් විසිනි. ''ඔවුහු අනුව ගායනා කළහ. ඔවුහු අනුව කියති.''[5] යනාදි යෙදුම්වලින් පැහැදිලි වන්නේ මෙකී වේදත්‍රය බ්‍රාහ්මණ සමාජයෙහි ආගමික සංස්ථාව තුළ ප්‍රධානත්වයෙන් සලකා ඇති බවය.

වේදත්‍රය ගුරු කොට ගනිමින් පසුකාලීනව සිටි බමුණෝ යාගහෝම පවත්වා ඔවුන්ගේ ආගමික ක්‍රියාවලිය ක්‍රියාත්මක කළහ. සාමාජික ක්‍රියාවලියේ දී රජු ප්‍රධානත්වය ගනු ලැබුව ද ආගමික

කාර්යයේ දී බ්‍රාහ්මණයෝ රජුටත් වඩා ප්‍රධානත්වයෙහි ලා සැලකුම් ලැබූහ. එමනිසා විශේෂයෙන් වේදත්‍රය කටපාඩමින් ඉදිරියට පවත්වාගෙන එනු ලැබුවේ ඔවුන් විසිනි. බමුණන් රහිතව කරන යාගය ඵල රහිත වූ හෙයින් යාගය පැවැත්වීම සඳහා ම කැප වූ බමුණන් සිව්දෙනෙක් වූහ. ඔවුහු හෝතෘ, උද්ගාතෘ, අධ්වර්යු හා යඥකාරක යන නම්වලින් හැඳින්වූහ.[6] අග්නි, යම, ඉන්ද්‍ර, වරුණ ආදී දෙවිවරුන්ට යාගය පිළිගැනීම සඳහා ආරාධනා කළ බමුණෝ 'හෝතෘ' නම් වූහ. මොවුහු ඍග් වේදය භාර තැනැත්තෝ වූහ. දෙවියන් පැමිණි පසු ඔවුන්ගේ ගුණ වර්ණනා කරමින් යාග මන්ත්‍ර ගායනා කළ පිරිස් 'උද්ගාතෘ' වූහ. ඔවුහු ගායනා කළ වේද පාඨ වූයේ යජුර් වේදයට අයත් ඒවාය. යාගය සිදු කරමින් දෙවියන් සතුටු කරමින් දෙවියන්ට පුද පූජා දෙන බමුණෝ ''අධ්වර්යු'' නම් වූහ. මොවුහු සාම වේදයේ භාරකරුවෝ වූහ. යාගයේ අඩුපාඩු කිසිවක් නොතිබිය යුතු හෙයින් ඒවා සොයා බැලීම ''යඥකාරක'' බමුණෝ සිදුකළහ. ත්‍රිවේදයට පසුව ඇති වූ අථර්ව වේදයේ භාරකරුවෝ මොවුහුය. මොවුහු අථර්ව වේදය පිළිබඳ පමණක් නොව අනෙක් වේදත්‍රය පිළිබඳව ද මනා දැනුමක් ඇත්තෝ වූහ. මේ අනුව මෙකී තනතුරු ලබා සිටි පිරිස් වේද ග්‍රන්ථවලට අයත් පාඨ කටපාඩම් කළ තැනැත්තෝ වූහ. එය ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා වේද පාඨ මතු පරම්පරාවට ඉගැන්වීම බමුණන් විසින් සිදුකරන ලදි. එහෙයින්ම මුලින් ත්‍රිවේදයේ හා පසුව චතුර්වේදයේ පාරප්‍රාප්ත බමුණන්ට සමාජයේ වැදගත් තැනක් හිමි වී තිබුණි. මෙයින් පැහැදිලි වන්නේ බ්‍රාහ්මණ සංස්ථාව තුළ ත්‍රිවේදය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් වශයෙන් ත්‍රිවේදය වනපොත් කොට ඇති බවය.

භාරතීය ආගමික සාහිත්‍ය ඉතිහාසය තුළ බ්‍රාහ්මණ සම්ප්‍රදායේ ඉගැන්වීම්වලට අභියෝගයක් වූයේ බෞද්ධ සම්ප්‍රදායේ ඉගැන්වීම්ය. බෞද්ධ සම්ප්‍රදාය ආරම්භ වී පන්සාළිස් වසක් ඇතුළත බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මයත්, පනවන ලද විනයත් අති විශාලය. එම ධර්මයේ හා විනයේ සුරක්ෂිතතාව සඳහා බුදුන් ජීවමාන අවධියේ දී ම යම් යම් විධි විධාන සලසා තිබූ බව පෙනේ. උන්වහන්සේගේ කාලයේ පටන් ම භාණක නමින් හැඳින් නොවුණත් ධර්මය මතක තබාගෙන ඉදිරියට රැකගෙන ඒමේ වැඩ පිළිවෙලක් පැවති බව පැහැදිලි වේ. බුද්ධකාලයේ පටන් ම විනය උපාලි හිමියන් විසින් ද, ධර්මය ආනන්ද හිමියන් විසින් ද ප්‍රධාන වශයෙන් දරන ලද බව ප්‍රකට කරුණකි. එමෙන් ම බුද්ධකාලයේ දීම ඇති වූ ධර්මකථික,[7] විනයධර[8] ආදි තනතුරු පිරිනැමීම මගින් ද එය තහවුරු වෙයි. බුද්ධකාලීනව සිටි මහසැරියුත් හිමියන් විසින් දේශනා කරන ලද බුදුරජුන් විසින් අනුමත කරන ලද සංගීති හා දසුත්තර සූත්‍ර බුදුදහමේ අනාගතය වෙනුවෙන් දේශිත සූත්‍ර ධර්ම දෙකක් බව සැලකේ. මීට හේතු වූයේ සමකාලීන ආගමික නායකයෙකු වූ නිගණ්ඨනාථපුත්තතුමාගේ අභාවයෙන් පසු ඔහුගේ අනුගාමිකයන් අතර ඇති වූ අර්බුදකාරී තත්ත්වයයි. එකී අනුගාමිකයෝ තමන් සිතූ පැතූ පරිදි කටයුතු සිදු කරන්නට වූහ. ඉන්පසු ඔවුන් අතර විවිධ ගැටළු නිර්මාණය වී එකිනෙකා අතර මතභේද, තර්ක, විතර්ක ඇතිවී විවිධ කොටස්වලට බෙදී ගියහ. මේ බව අවබෝධ කරගත් සැරියුත් මහරහතන් වහන්සේ ඉහත සඳහන් සූත්‍ර දෙක දේශනා කොට ඒ වනතෙක් දේශිත ධර්ම කොටස් එක් තැන් කොට තැබීය.

එක් කෙනෙකුට පමණක් නායකත්වය දීමෙන් අනෙක් අය ඊට විරුද්ධව ඔවුනොවුන් අතර ගැටළු මතුවේය යන්න අවබෝධ කරගත් බුදුරජුන් පරිනිර්වාණයට ප්‍රථම ආනන්ද හිමියන් අමතා දේශනා කරන්නේ ''ආනන්දය, මා විසින් යම් ධර්මයක්, විනයක් දේශනා කරන ලද්දේ ද, පණවන

ලද්දේ ද, එය මාගේ ඇවෑමෙන් තොපට ශාස්තෲ වන්නේය.''[9] යනුවෙනි. මෙම දේශනාවට අනුව බුදුදහම තුළ විශේෂිත වූ නායකයෙක් පත් නොකළ නිසාත්, ධර්මය ශාස්තෲවරයා ලෙස පිළිගත් නිසාත් බුදුරජුන්ගෙන් පසු ධර්මය ආරක්ෂා කොට ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කරන්නට සිදුවිය.

විශේෂයෙන් ම බුදුරජුන්ගේ පරිනිර්වාණයෙන් පසු ඇතැම් භික්ෂූහු ශෝකය දරා ගැනීමට නොහැකිව බිම පෙරළෙමින්, හිසෙහි අත්බැඳ විලාප දෙමින්, ක්ලාන්ත වී වැටුණහ.[10] ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහළු භික්ෂුව විසින් ''ඇවැත්නි කම් නැත. ශෝක නොකරවු. නොවැළපෙවු. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිඳුණෙමු. මෙය තොපට කැපය. මෙය තොපට අකැපය යයි කීමෙන් උපද්‍රවයට පත්කරන ලද්දෝ වෙමු. දැන් අපි යමක් කැමති නම් එය කරන්නෙමු. යමක් අකමැතිනම් එය නොකරන්නෙමු''[11] යන ප්‍රකාශය අසා ධර්ම සංවේගයට පත් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රධාන මහරහතන් වහන්සේලා විසින් ඒ වනවිට නොගෙතු මල් රැසක් මෙන් විසිරී පැතිරී පැවති ධර්ම විනය එක්තැන් කිරීම සඳහා අදහස් කරන ලදි. ''ඇවැත්නි අපි අධර්මය බැබළීමටත්, ධර්මය බැහැර වීමටත් පෙර, අවිනය බැබළීමටත්, විනය බැහැර වීමටත් පෙර, අධර්මවාදීන් බලවත් වීමටත්, ධර්මවාදීන් දුබලවීමටත් පෙර, අවිනයවාදීන් බලවත් වීමටත්, විනයවාදීන් දුබලවීමටත් පෙර ධර්මය ද විනය ද සංගායනා කරම්හ''[12] යනුවෙන් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ කළ දැනුම්දීම අනෙකුත් භික්ෂූන් වහන්සේලා පිළිගත්හ. මේ සංගායනාව සඳහා පන්සියයක් මහරහතන් වහන්සේලා රැස්කළ අතර, ආනන්ද හිමියන්ගේ සහභාගීත්වය අනිවාර්ය විය. බුදුරජුන් විසින් දේශනා කරන ලද සියලු ධර්ම කොටස් දැන සිටියේ උන්වහන්සේය. බුදුරජුන් වැඩ සිටින සමයේ ආනන්ද හිමියන් ලැබූ අග්‍ර තනතුරු ප්‍රමාණය දෙස බැලීමෙන් ඒ බව පෙනේ. අනෙකුත් මහරහතන් වහන්සේලා එක් එක් තනතුරු ලැබුවත් ආනන්ද හිමියන්ට තනතුරු කිහිපයක් ම පිරිනමා ඇත. ''යම් ආනන්ද නම් මහණෙක් වේද, බොහෝ ඇසූ පිරූ තැන් ඇති මාගේ සියලු මහණුන් අතුරෙහි මේ අග්‍ර වෙයි.... ධාරණස්මෘති ඇති මහණුන් අතරෙහි මේ අග්‍ර වෙයි....ප්‍රඥාගති ඇති.....ධෘතිමත් වූ....උපස්ථායක වූ මාගේ මහණුන් අතර මේ අග්‍ර වෙයි.''[13] මෙම තනතුරුවලින් එකක් වන්නේ ධාරණ ශක්තියකින් හෙබි යන්නයි. ඒ අනුව ආනන්ද හිමියන් ධාරණ ශක්තියෙන් අගතැන්පත් තෙර නමකි. උන්වහන්සේට දේශනා කරන ධර්මයක වචන 60,000 ක් අකුරක් නෑර එකවර මතක තබා ගැනීමේ ශක්තිය තිබුණි. මෙබඳු හැකියාවක් තිබූ පෘථග්ජන භික්ෂූන් අතර ආනන්ද හිමියන් ප්‍රමුඛ වේ.

**භාණක සම්ප්‍රදාය**

ප්‍රථම සංගීතියෙන් පසු විසිරී පැතිරි පැවති සියලු ධර්ම කොටස් විනය, සූත්‍ර, අභිධර්ම වශයෙන් පිටක තුනක් යටතේ සංග්‍රහ කළ බව අටුවාචාරී මතයයි.[14] අනතුරුව ඒ ඒ ධර්ම කොටස් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ආචාර්ය පරම්පරාවන්ට භාරදුන් බව කියවේ. එහිදී විනය පිටකයේ උභතෝ විභංගයත්, (පාරාජිකාපාළි, පාචිත්තියපාළි) ඛන්ධක (චුල්ලවග්ගපාළි, මහාවග්ගපාළි) හා පරිවාරයත් (පරිවාරපාළි) විමසා අවසානයේ එහි සම්පූර්ණ වගකීම හා ඉදිරියට පවත්වාගෙන යාමේ කාර්යය උපාලි මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවට පැවරිණි.[15] සූත්‍ර පිටකයට අයත් සූත්‍ර සියල්ල සංගායනා කොට නිකාය වශයෙන් කොටස් පහකට බෙදා එක් එක් පරම්පරාවන්ට භාර කළ බව සමන්තපාසාදිකා, සුමංගලවිලාසිනී වැනි අට්ඨකථාවන්හි සඳහන් වේ. නිකාය ග්‍රන්ථ පහෙන් මුල් සතර නිකාය වෙන වෙන ම රහතුන්ට පවරා තිබේ.[16]

1. දීඝනිකාය ආනන්ද හිමියන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද
2. මජ්ඣිම නිකාය සාරිපුත්ත හිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවට ද
3. සංයුත්ත නිකාය මහාකාශ්‍යප හිමියන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද
4. අංගුත්තර නිකාය අනුරුද්ධ හිමියන් ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ද

අයත් විය. ඛුද්දක නිකායෙහි භාරකාරත්වය ඉහතින් සඳහන් කළ සියලු භික්ෂූන්ට පිරිනැමූ බව අටුවාචාරී මතයයි. මෙකී නිකාය ග්‍රන්ථ භාරගන්නා ලද තෙරවරුන්ට ඒ ඒ කොටස ධාරණය කරගෙන පරම්පරාවෙන් පරම්පරාවට ආරක්ෂා කර ගැනීම වගකීම විය. මුල් යුගයේ දී මෙලෙස ධර්මය ආරක්ෂා කරගෙන පවත්වාගෙන පැමිණි පිරිස විශේෂ නමකින් හඳුන්වා නොමැති බව විනය ටීකාව වන <u>විමති විනෝදනී ටීකාවේ</u> සඳහන් වේ. එහිදී ධර්ම විනය ආරක්ෂා කරගෙන පවත්වාගෙන යාමට භාරදුන් පිරිස් පිළිබඳ ව සඳහන් වන්නේ ''පෙර මහ තෙරවරු පර්යාප්තිය අතුරුදහන් නොවීමට පෙර එක් එක් ගණයට භාර දී ඇත. ඒ අනුව දීඝනිකායාදී ධර්ම කොට්ඨාශ භාරදෙමින් ඔබලා මේ පෙළ දහම හා අට්ඨකථා පරිහරණය කරවු. ඉදිරියට ද උගන්වවු යැයි කියා සියලු ධර්ම කොට්ඨාශ ග්‍රන්ථ වශයෙන් ලබා දුන්හ. ඔවුහු පසුකාලීනව දීඝභාණකාදි වශයෙන් නම් ලැබූහ.''[17] මෙයින් පැහැදිලි වන්නේ මුලදි එක් එක් පිරිස් ''ගණ'' යන නාමයෙන් හඳුන්වා ඇති බව හා පසුකාලීනව භාණකවරු ලෙස ප්‍රචලිත වූ බවය. ඒ අනුව ඔවුන් දීඝභාණක, මජ්ඣිම භාණක, සංයුත්ත භාණක හා අංගුත්තර භාණක වශයෙන් බෙදා දැක්විණ. ඒ අනුව භාණකවරු තමන්ට අයත් වූ ඒ ඒ ධර්ම කොට්ඨාශ කටපාඩමින් පවත්වාගෙන එනු ලැබූහ. එය තම ගෝල බාලාදීන්ට ද ඉගැන්වූහ.

ඛුද්දක නිකාය හා අභිධර්ම පිටකය සම්බන්ධයෙන් භාරකාරත්වය ඉසිලූ ගණ සමූහයා හෝ භාණකවරුන් පිළිබඳ ව නිශ්චිත තොරතුරු ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ තොරතුරු සපයන පැරණිතම මූලාශ්‍රය වන චුල්ලවග්ග පාළියේ පඤ්චසතිකඛන්ධකයේ දක්නට නොමැත. එහෙත් <u>මිලින්දපඤ්හයේ</u> භාණකවරුන් පිළිබඳ ව දැක්වෙන තැනෙ දී ''ඛුද්දක භාණක'' යන වචනය ද ඇතුළත් වේ.[18] මිලින්දපඤ්හය අට්ඨකථාවලට පෙර රචනා වූවකි. මිලින්දපඤ්හය රචනා වූ කාලයේ පැවති භාණක පරම්පරා පහ භාරතයේ සිටියේ නම් ලක්දිව ඛුද්දක භාණකයන් ගැන සඳහන් නොවන්නේ කවර හේතුවක් නිසාද යන්න පැහැදිලි නැත. බුද්ධඝෝෂ හිමියන්ට ඔවුන් පිළිබඳ ව සඳහන් කරන්නට අවස්ථාවක් නොතිබුණි ද? කෙසේ වුවත් ඛුද්දක භාණකයන්ගේ ප්‍රභවය ලක්දිව නොව භාරතයේ ම සිදු වූ බව යථොක්ත <u>මිලින්දපඤ්හ</u> පාඨයෙන් පැහැදිලි වේ. අට්ඨකථාවන්හි සඳහන් වන තොරතුරුවලට අනුව ඛුද්දක නිකායේ මෙන් ම අභිධර්ම පිටකයේ ද භාරකරත්වය ප්‍රථම සංගීතියට සහභාගී වූ පන්සියයක් මහරහතන් වහන්සේලාට හෝ දීඝභාණකාදී සියලු භාණකවරුන්ට පැවරෙන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් ඛුද්දක නිකාය හා අභිධර්ම පිටකය සම්බන්ධයෙන් විවිධ මත පවතී. දීඝභාණකයින් පවසන්නේ ඛුද්දක නිකාය අභිධර්ම පිටක පර්යාපන්න කෘතියක් වශයෙනි.[19] එසේම වර්තමානයේ දක්නට ලැබෙන ඛුද්දක නිකායාගත ග්‍රන්ථ පහළොව ම ඔවුන් පිළිගන්නේ නැත. ඛුද්දක පාඨ, චරියාපිටක, අපදාන හා බුද්ධවංස යන ග්‍රන්ථ දීඝභාණක වර්ගීකරණයේ නොමැත. මජ්ඣිම භාණකයෝ ඛුද්දක පාඨය හැර අනෙක් ග්‍රන්ථ දහහතර පිළිගන්නා අතර, ඛුද්දක ග්‍රන්ථ සියල්ලක් ම සූත්‍ර පිටකයෙහි ලා සඳහන් කරති.[20] නූතනයේ අභිධර්ම පිටකය බුද්ධභාෂිතයක් නොවන බව බොහෝ දෙනාගේ පිළිගැනීම වුවත් අට්ඨකථාකරු පවසන්නේ එය

බුද්ධභාෂිතයක් ම බවය.[21] තව්තිසා දිව්‍ය ලෝකයේ දී මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කොට විවේක අවස්ථාවන්හි දී අනෝතත්ත විල්තෙරට වැඩි බුදුරජුන් විසින් සැරියුත් මහරහතන් වහන්සේට නැවත දේශනා කරන ලදි. සැරියුත් මහරහතන් වහන්සේ විසින් අභිධර්මය වාචනා මාර්ගයට නගා සිය අතවැසි භික්ෂූන් පන්සියයකට ඉගැන්වූ බව සඳහන් වේ. ඒ අනුව අභිධර්මයේ වාචනා මාර්ගය සාරිපුත්ත මහරහතන් වහන්සේගෙන් ආරම්භ වී ඇත.[22] එසේ ආරම්භ වූ අභිධර්ම පිටකය අන්‍ය භික්ෂු ගණයකට නොපවරා ඉදිරියට පවත්වාගෙන යෑමේ වගකීම සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍ය පරම්පරාවට ම පවරන්නට ඇතැයි සිතිය හැකිය. තෙවෙනි ධර්ම සංගායනාව තෙක් අභිධර්මය කටපාඩමින් පවත්වාගෙන ආ ශිෂ්‍ය පරම්පරාවට අයත් භික්ෂූන් පිළිබඳ වාර්තාවක් අත්ථසාලිනී අට්ඨකථාවේ සඳහන් වේ. එහි එන අන්දමට ශිෂ්‍ය පරම්පරාව මෙසේය. ''භද්දජී, සොභිත, පියජාලි, පියපාල, පියදස්සි, කෝසියපුත්ත, සිග්ගව, සන්දේහ, මොග්ගලීපුත්තතිස්ස, සුදත්ත, ධම්මිය, දාසක, සොණක, රේවත'' ආදීහුය.[23]

මෙසේ ප්‍රථම සංගීතියේදී ම භාණක පරම්පරාවන්ට අයත්ව තිබූ බුද්ධ දේශනා සියල්ලක් ම සංගීතිකාරක තෙරවරුන්ගේ ප්‍රධානත්වයෙන් ඉදිරියට පවත්වාගෙන ආ බව දෙවෙනි සංගීති වාර්තාව පිළිබඳ තොරතුරු සපයන චුල්ලවග්ගපාළියේ[24] හා තෙවෙනි ධර්ම සංගායනාව පිළිබඳ තොරතුරු සපයන සමන්තපාසාදිකාවේ[25] එන තොරතුරුවලින් පැහැදිලි වේ.

## ලක්දිව ආචාර්ය පරම්පරා

ඉහතින් සඳහන් කළ අන්දමට ධර්මය කටපාඩම් කොට ඉදිරියට පවත්වා ගත් භික්ෂු පිරිස අඛණ්ඩව පැවතගෙන ආහ. තුන්වෙනි ධර්ම සංගායනාව තෙක් විනය පිටකය පවත්වාගෙන ආ ආචාර්ය පරම්පරාව පිළිබඳ ව අට්ඨකථාකරු පැහැදිලි කරන්නේ මෙසේය.

උපාලි දාසකෝ චෙව - සෝණකෝ සිග්ගවො තථා
තිස්සෝ මොග්ගලීපුත්තෝ ච - පඤ්චෙතෙ විජිතාවිනො

පරම්පරාය විනයං - දීපෙ ජම්බුසිරිව්හයෙ
අච්ඡිජ්ජමානං ආනෙසුං- තතියො යාව සංගහො[26]

උපාලි, දාසක, සෝණක, සිග්ගව හා මොග්ගලීපුත්තතිස්ස යන රහතන් වහන්සේලා පස් නම තෘතීය සංගායනාව තෙක් අඛණ්ඩව පැවති පරම්පරාවයි. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ ශිෂ්‍යයා මහින්ද මහරහතන් වහන්සේය. උන්වහන්සේ ලක්දිවට වැඩමකොට ලක්දිව බුද්ධශාසනය පිහිටුවා අරිට්ඨ ඇමතියා පැවිදි කරවා ලක්දිව ආචාර්ය පරම්පරාව පිහිටවූහ. ඉන්පසු ලක්දිව ඇති වූ ආචාර්ය පරම්පරාව පිළිබඳ ව ගාථා 15 කින් යුත් දීර්ඝ නාම ලේඛනයක් සමන්තපාසාදිකවේ සඳහන් වේ.[27] මෙහි සඳහන් වන අන්දමට උපාලි මහරහතන්ගෙන් පැවතගෙන එන විනය ආචාර්ය පරම්පරාව පිළිබඳ ව පමණක් තොරතුරු හමුවේ. තෘතීය සංගායනාව වනවිට අනෙකුත් පරම්පරාවල වැඩ සිටි භික්ෂූන්ගේ නම් පිළිබඳ ව තොරතුරු හමු නොවුණත් ලක්දිව දී ද එකී භාණක පරම්පරා තිබුණු බවට සාධක හමුවේ.[28] එසේම මිහිඳු මහරහතන් වහන්සේ ත්‍රිපිටකය හා

අටුවාව රැගෙන ලක්දිවට වැඩම කළ බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ.[29] ඒ අනුව ලක්දිව බුද්ධශාසනය පිහිටුවන අවස්ථාවේ මිහිඳු මහරහතන් වහන්සේ විසින් ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට භාජනය වූ ත්‍රිපිටකයට අදාළ සියලු බුද්ධ දේශනා භාරව සිටි ඒ ඒ ආචාර්ය පරම්පරාවට අයත් භික්ෂූන්ගෙන් ඉගෙන ගෙන ලක්දිවට වැඩම කොට ඇත. එකී ත්‍රිපිටකය ලක්දිව බුදුසසුන පිහිටුවීමෙන් අනතුරුව ලක්දිව ඇති වූ භික්ෂු පරම්පරාවට උගන්වා ඇත. ඒ අනුව මේ කාල වකවානුව වනවිටත් සියලු බුද්ධවචනය ඒ ඒ භික්ෂු පරම්පරා විසින් වනපොත් කොට කටපාඩමින් ආරක්ෂා කරගෙන ආ බවට කිසිදු සැකයක් නැත.

ලක්දිව දී ත්‍රිපිටකය කටපාඩමින් පවත්වාගෙන යාම සඳහා මුල් කාලයේ සිටි උගත් භික්ෂූන් වහන්සේලා වර්ග තුනකට අයත් වූහ. උන්වහන්සේලාට ත්‍රිපිටකයේ අන්තර්ගත ඒ ඒ ධර්ම කොටස් භාර වී තිබිණි. **නිස්සයමුච්චනක, පරිසුපට්ඨාපක, හා භික්ඛුණෝවාදක** යනුවෙන් එම වර්ග තුන හඳුන්වා තිබේ. නිස්සයමුච්චනක වර්ගයට අයත් භික්ෂූන් වහන්සේලා උපසම්පදාවෙන් වර්ෂ පහක් ගත වූවෝ වෙති. උන්වහන්සේලාට අවම වශයෙන් උභයමාතික, පාතිමොක්ඛය, සතර බණවර, අන්ධකවින්ද, මහාරාහුලොවාද, අම්බට්ඨ යන සූත්‍ර කොටස් කටපාඩමින් සජ්ඣායනා කිරීමට හැකියාව තිබිය යුතු විය. උපසම්පදා වී දස වසරක් සම්පූර්ණ වූ භික්ෂූන් වහන්සේලා පරිසුපට්ඨාපක නම් වූහ. උන්වහන්සේලා අවම වශයෙන් විනය පිටකයේ විභංග දෙක ද, ඛන්ධක ද, මජ්ඣිම භාණකයකු නම් මූල පණ්ණාසකයේ සූත්‍ර පණහ ද, දීඝභාණකයෙකු නම් මහාවග්ගයේ සූත්‍ර දහය ද, සංයුත්ත භාණකයෙකු නම් සංයුත්ත නිකායේ ප්‍රථම කොටස් තුන ද, අංගුත්තර භාණකයෙකු නම් අංගුත්තර නිකායේ පළමු හෝ දෙවන භාගය ද, එසේ නොහැකි නම් එහි තික නිපාතය දක්වා ද, ජාතක භාණකයෙකු නම් අටුවා සහිත මුළු ජාතක පාළිය ද, කටපාඩමින් කිය හැකි විය යුතුය. මේ සියල්ල කටපාඩම් ඇති භික්ෂූහු බහුස්සුත, දිසාපාමොක්ඛ ආදි විරුද නම්වලින් හැඳින්වූහ. ඉහළ ම පිළිගැනීමක් තිබූ භික්ඛුණෝවාදක (භික්ෂුණීන්ට අවවාද දෙන්නා) තෙමේ ත්‍රිපිටකය හා අර්ථකථන දැනගත යුතු විය. එසේ නැතහොත් ප්‍රධාන නිකාය හතරේ අට්ඨකථා ද, අභිධර්ම පිටකයේ ග්‍රන්ථ හතරක අට්ඨකථා ද සහිතව මුළු විනය පිටකය ම දැනගෙන සිටිය යුතු විය.[30] මෙම වර්ගීකරණය භාණක ක්‍රමය හා ආගමික අධ්‍යාපනය යන දෙක ම පදනම් කරගෙන පිළියෙල කරන ලද්දකි. මුලදී ත්‍රිපිටකයත් අට්ඨකථාවත් මෙකී උගත් තෙරවරුන් විසින් ආරක්ෂා කරගෙන පැමිණි ඇති අයුරු මෙයින් පැහැදිලි වේ. ඒ අනුව ලක්දිව සිටි භික්ෂූන් වහන්සේලා භාරතයේ වැඩ සිටි භාණක පරම්පරාවෙන් ම පැවතගෙන ආ අය වූ බව පැහැදිලිය.

භාරතයේ ඇති වූ භාණක පරම්පරාව වර්ග සතරක් වුවත් බුද්ධඝෝෂ හිමියන් විසින් අටුවා රචනා කරන කාලය වනවිට භාණක පරම්පරා 18 ක් තිබුණ බව ධම්මපදට්ඨකථාවේ සඳහන් වේ. එහි සඳහන් වන අන්දමට ග්‍රන්ථධුරය පුරන භික්ෂුවක් තෙවළා බුදුදහම ඉගෙන පන්සියයක් භික්ෂූන්ට උගන්වමින් අටළොස් මහා ගණයකට ආචාර්යවරයෙක් වශයෙන් කටයුතු කර ඇත.[31] මෙකී සාධක අනුව අටළොස් භාණකයන් පිළිබඳ ව තොරතුරු සඳහන් වුවත් එකී අටළොස් භාණකවරුන් කවුරුන්ද යන්න පෙන්වා දී නොමැත. එහෙත් ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසය තුළ විවිධ ස්ථානවලින් හමුවන අටළොස් භාණක පරම්පරාව වන්නේ

1. දීඝභාණක
2. මජ්ඣිම භාණක

10. පරිවාර භාණක
11. ධම්මසංගණී භාණක

| | |
|---|---|
| 3. සංයුත්ත භාණක | 12. විභංග භාණක |
| 4. අංගුත්තර භාණක | 13. ධාතුකථා භාණක |
| 5. ඛුද්දක භාණක | 14. කථාවත්ථු භාණක |
| 6. පාරාජිකා භාණක | 15. පුග්ගලපඤ්ඤත්ති භාණක |
| 7. පාචිත්තිය භාණක | 16. යමක භාණක |
| 8. චුල්ලවග්ග භාණක | 17. පට්ඨාන භාණක |
| 9. මහාවග්ග භාණක | 18. ජාතක භාණක |

වශයෙනි.[32] මෙහි දැක්වෙන පරිදි ත්‍රිපටකයට අදාළ ග්‍රන්ථ සියල්ලටම වෙන වෙන ම භාණකවරුන් ප්‍රවීණත්වයක් ලබා තිබූ බව පැහැදිලිය. භාණක යන නාමයෙන් හැඳින් නොවුණත් ත්‍රිපිටක හෝ එහි යම් කොටසක් හෝ ආරක්ෂා කරමින් පවත්වාගෙන එන්නට ඇතැයි සිතිය හැකි පිරිසක් පිළිබඳ ව තොරතුරු අටුවා ග්‍රන්ථවල සඳහන් වේ. ඔවුන් සුවිශේෂී නාමයන්ගෙන් හඳුන්වා ඇත. ත්‍රිපිටකධාරී, විනයධර, ධම්මධර, ආභිධම්මික, චතුනිකායික, උභතො විභංග භාණක, මහාපකරණිය වැනි නම් ඔවුන් හැඳින්වීම සඳහා යොදා ගැණින.

''ත්‍රිපිටකධාරී'' භික්ෂූන් වහන්සේලා වනාහි ත්‍රිපිටකය පමණක් නොව අටුවා ද ඉගෙන ගෙන එහි ආචාර්යත්වයට පැමිණ සිටි පිරිසක් වූහ. අනුරාධපුර මහාවිහාරයේ වැඩ සිටි ''ත්‍රිපිටක චූලාභය'' නම් තෙරුන් එම ගණයෙහි ලා සැලකූ ප්‍රසිද්ධ තෙර නමකි. උන්වහන්සේගේ ධාරණ ශක්තිය පිළිබඳ ව <u>සුමංගල විලාසිනියේ</u> සඳහන් වන්නේ මෙසේය. ''අනුරාධපුරයෙහි සතර වාසල් දොරටුවලින් තුන් දොරක්ම වසා එක් දොරකින් උදයේ මිනිසුන් පිටත් කරවන්නේ නම් ත්‍රිපිටකධාරී මෙම තෙරුන් වහන්සේ ඔවුන්ගේ නම් විචාරා සිත තබාගෙන නැවත සවස ඔවුන් එම දොරින් ම ඇතුල් වන අවස්ථාවේ ඔවුන්ගෙන් නොවිචාරා ම සියලු දෙනාගේ නම් කීමට තරම් මතක ශක්තියක් තිබුණි.[33] ත්‍රිපිටකධාරී හෝ පිටකත්‍රයෙහි දක්ෂ වූ තෙරුන් වහන්සේලා පිළිබඳ ව තොරතුරු <u>සමන්තපාසාදිකාවේ</u> ද සඳහන් වේ. එනම්- ඛෙම, මහාකවි, මහාසිව, අභය, මහානාග, තිස්ස යනාදි තෙරවරුය.[34]

''විනයධර'' යන නාමයෙන් හැඳින් වූ භික්ෂු පිරිස විශේෂයෙන් ම විනය පිටකය හදාරා එහි ආචාර්යත්වයට පැමිණ භික්ෂුත්වය ආරක්ෂා කරමින් පැමිණි පිරිසක් බව <u>සමන්තපාසාදිකාවේ</u> සඳහන් වේ.[35] විනය පිළිබඳ ව හසළ දැනුමකින් සිටි තෙරවරු රාශියක් පිළිබඳ තොරතරු මූලාශ්‍රවලින් හමුවේ. ඒ අතර සුමන, උපාලි, තිස්ස, චූලාභය, සීව, තිස්සදත්ත ආදි නම්වලින් හැඳින් වූ තෙරවරු ප්‍රධාන වෙති. වළගම්බා රජුගේ කාලයේ ලක්දිව ඇති වූ බැමිණිටියා සාය වනවිට විනය පිටකය ආරක්ෂා කළ තෙරවරුන් ලෙස සැලකෙන්නේ උපතිස්ස හා ඵුස්සදේව යන හිමිවරු දෙදෙනාය. මෙයින් පැහැදිලි වන්නේ මොවුන් ''භාණක'' යන නම්වලින් හැඳින් නොවුණත් විනය පිටකය කටපාඩමින් රැගෙන ආ භික්ෂු පිරිස් වූ බවය.

''ධම්මධරාති සුත්තන්ත පිටකධරා''[36] ''පරියත්ති පටිවෙධ ධම්මානංයෙව ධාරණතො ධම්මධරා'ති එවම්පෙත්ථ අත්ථො දට්ඨබ්බො''[37] යනුවෙන් නිරුක්ති දක්වන ආකාරයට ''ධම්මධර'' යනුවෙන් හැඳින්වෙන්නේ සූත්‍රාන්ත පිටකය දැරූ භික්ෂූන් වහන්සේලාය. ''ආභිධම්මික'' යනුවෙන් හඳුන්වා ඇත්තේ අභිධර්ම පිටක හදාරා එහි ආචාර්යත්වයට පත් භික්ෂූන් වහන්සේලාය. පළමු ආභිධම්මිකයාණෝ බුදුරජාණන් වහන්සේමය. අට්ඨකථාවට අනුව උන්වහන්සේ ප්‍රථමාභිසම්බෝධියෙන් අනතුරුව පළඟක් බැඳගෙන අභිධර්මය අවබෝධ කරගෙන ඇත.[38] ඉන්පසු

කාලවල දී ''ආභිධම්මික'' යන නාමයෙන් හැඳින් වූ තෙරුන් වහන්සේලා විශාල පිරිසක් සිටි බව අත්ථසාලිනී අට්ඨකථාවෙහි සඳහන් වේ. ''තිස්සභූති, ග්‍රාමවාසී සුමනදේව'' යන තෙරවරු ඉන් ප්‍රධාන තැනක් ගනිති.[39] භාතිය රජුගේ කාලයේ ''ගෝදත්ත'' නමින් හැඳින්වූ ආභිධම්මික තෙර කෙනෙකු සිටි අතර රජු විසින් උන්වහන්සේට නඩු ඇසීමට පවරන ලද බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ.[40] උන්වහන්සේ විනය පිටකයේ ද දක්ෂයෙකු බව එහි ම සඳහන් වේ. මිලින්දපඤ්හයේ සඳහන් වන අන්දමට නාගසේන තෙරුන් මෙන් ම ගෘහපතියෙක් වූ පාටලීපුත්ත ද ආභිධම්මිකයෙකි.[41]

චතු නිකායික නාමයෙන් හැඳින්වූ භික්ෂූන් වහන්සේලා දීඝ, මජ්ඣිම, සංයුත්ත හා අංගුත්තර යන නිකාය ග්‍රන්ථ හදාරා ඒවායෙහි ප්‍රවීණත්යට පැමිණි අය වූහ. මෙය තහවුරු කෙරෙන සාධකයක් මනෝරථපූරණියෙහි දැක්වේ. චතු නිකායික තිස්ස තෙරුන් විසින් දත්තාභය තෙරුන් රෝගී වූ අවස්ථාවේ කබලිංකාහාරය කමටහන් වශයෙන් අරමුණු කරගෙන භාවනා කරන ලෙසත් එකී භාවනාව අවසානයේ උන්වහන්සේ රහත් ඵලයට පත් වූ බවත් සඳහන් වේ.[42] උභතො විභංග භාණකයෝ භික්ඛු - භික්ඛුණී යන උභය විභංගය හදාරා ධර්මය ආරක්ෂා කළ අය වූහ. සමන්තපාසාදිකා අටුවාවේ දී චීවර අධිෂ්ඨානය පිළිබඳ ව මතභේදයක් පැවති අවස්ථාවේ පුණ්ණවල්ලියවාසී උභතොවිභංගභාණක මහාතිස්ස තෙරුන් පවසන්නේ පෙර මහ තෙරවරු විසින් දක්වන ලද ආකාරයට තුන් සිවුර ''පරික්ඛාර චෝළ'' වශයෙන් අධිෂ්ඨාන කිරීම සුදුසු බවය.[43] මෙහි පරික්ඛාර චෝළ යනු තුන් සිවුර වෙන වෙන ම ගෙන අධිෂ්ඨාන කිරීමය. භික්ෂූන් අතර ඇති වූ මතභේදය වූයේ තුන් සිවුර එකට ගෙන අධිෂ්ඨාන කරනවාද නැතහොත් වෙන වෙන ම අධිෂ්ඨාන කරනවාද යන්නයි. මහාපකරණීය භික්ෂූන් වහන්සේලා අභිධර්ම පිටකයේ පට්ඨාන ප්‍රකරණයෙහි දක්ෂයින් වූහ.

ඉහතින් සඳහන් කරන්නට යෙදුණ භාණක සම්ප්‍රදායන් සේම වෙනත් භාණක පරම්පරා කිහිපයක් පිළිබඳ තොරතුරු ඊ. ඩබ්. අදිකාරම් මහතා සපයයි.[44] එනම්:-

1. ධම්මපද භාණක- මොවුන් පිළිබඳ තොරතුරු අල්පය. ධම්මපදට්ඨකථාවේ මහාතිස්ස නමින් හැඳින් වූ ධම්මපද භාණක තෙර නමක් පිළිබඳ තොරතුරු දැක්වේ. උන්වහන්සේ දුටුගැමුණු රාජ්‍ය සමයේ විසුවෙකි.
2. මහාඅරියවංස භාණක- මහාඅරියවංස භාණක පරම්පරාවක් පිළිබඳ ව සංයුත්ත නිකාය අට්ඨකථාවේ දැක්වේ.
3. මහාවත්තාළීසක භාණකයෝ- මෙනමින් හැඳින්වෙන භාණකයෝ පිළිබඳ තොරතුරු සඳහන් වී ඇත්තේ සම්මෝහවිනෝදනී ටීකාවේ පමණි.

## ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

තෙවළා බුදුදහම කටපාඩමින් රැගෙන ආ භික්ෂූන් වහන්සේලා ක්‍රි. පූ 1 වන සියවසේ දී මහත් දුෂ්කරතාවලට මුහුණ පෑහ. ලක්දිව වර්ෂ දොළහක් බැමිණිටියා සාය නමින් සාගතයක් පැවතුණි. එකල අනුරාධපුර රාජධානියේ පාලනය ද ද්‍රවිඩයින් සතු විය. සිංහල රජු වූ වළගම්බා රජු කැලයේ සැඟ වී සිටියේය. මේ කාලයේ දුර්භික්ෂයත් රාජ්‍ය අනුග්‍රහය නොලැබීමත් නිසා භික්ෂූන් වහන්සේලා අසරණ වූහ. ඇතැම් භික්ෂූහු ඉන්දියාට ගියහ. ඇතැම්හු මිය ගියහ. සමහර මිනිස්සු මහා සංඝයා පවා මරා ගෙන කෑහ.[45] කොටසක් ලක්දිව ම රැඳෙමින් ජීවිත පරිත්‍යාගයෙන් ත්‍රිපිටකය හා අට්ඨකථාව

ආරක්ෂා කළහ. උන්වහන්සේලා කෙතරම් දුෂ්කරතාවකට මුහුණ දුන්නේද යන්නට නිදසුන් දෙකක් අට්ඨකථාවල එන තොරතුරුවලින් පැහැදිලි වේ.

1. භාණකයෝ ආහාර දුර්වලත්වය නිසා දුර්වලව සිටි හෙයින් වැලි ගොඩක් වටා රැස්ව එයට හිස තබා දිගාවී දුර්වල හඬින් එකිනෙකාට ඇසෙන සේ ත්‍රිපිටකය සජ්ඣායනා කළහ.[46]

2. එකළ මහානිද්දේසය කටපාඩමින් කියන්නට පුළුවන් එක් භික්ෂුවක් පමණි සිටියේ. උන්වහන්සේ සිල්වතෙකු නොවූ හෙයින් සිල්වත් භික්ෂූන් උන්වහන්සේ සමීපයට ගොස් එය අසා කටපාඩම් කරන්නට පොළඹවා ගත නොහැකි විය. අවසානයේ දී සාමණේර නමක් එම කාර්යය සඳහා යොදවා අභාවයට යන්නට ගිය මහානිද්දේසය රැකගත්තේය.[47]

මේ කාලවකවානුවේ ඇති වූ සාගතය නිසා ඉදිරියටත් එවැනි තත්වයක් උද්ගත වේය යන බියෙන් එකල සිටි මහ තෙරවරු එතෙක් කාලයක් කටපාඩමින් රැගෙන ආ ත්‍රිපිටකය හා අටුවාව ග්‍රන්ථාරූඪ කිරීමේ කාර්යයට මුල පුරන්නට වූහ. එසේම වරින්වර ලක්දිව ඇති වූ සතුරු ආක්‍රමණ ද මේ සඳහා බලපාන්නට ඇත. තවද කල්යත්ම වගකීමක් නැති දුශ්ශීලයන් ශාසනයට ඇතුළත්ව සිටි නිසා නිර්මල ධර්මය ආරක්ෂා කර ගැනීම සඳහා උද්යෝගිමත් පිරිසක් ඇති නොවීම ද තවත් හේතුවක් විය. මහාවිහාරයෙන් වෙන් වූ පක්ෂයක් අභයගිරියෙහි ඇති වීමත් රජුගේ සැලකිල්ල මහාවිහාරවාසී භික්ෂූන්ට වඩා අභයගිරිවාසී භික්ෂූන් කෙරෙහි යොමු වීමත් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට තවත් ප්‍රබල හේතුවක් වූ බව අදිකාරම් මහතාගේ අදහසයි.[48] ඒ අනුව භාණක ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාමේ අපහසුව මේ වාතාවරණය යටතේ තදින් ම පෙනී ගොස් තිබේ. එමනිසා ථෙරවාද ශාසන ඉතිහාසයේ නව යුගයක් උදා කරමින් ශතවර්ෂ හතරක පමණ කාල පරිච්ඡේදයක් පවත්වාගෙන ආ භාණක ක්‍රමය මගින් පමණක් ත්‍රිපිටකය ආරක්ෂා කර ගැනීම පිළිබඳ අදහස වෙනස් කොට භාණක ක්‍රමයට අමතර ව ත්‍රිපිටක පොත්වල ලියා රැක ගැනීම ද මෙයින් ආරම්භ විය.

**නිගමනය**

ඉහතින් සඳහන් කරන්නට යෙදුණ වනපොත්කරණය පැරණි භාරතීයයන් විසින් තමන්ගේ ආගමික දර්ශන ඉදිරියට පවත්වාගෙන යාම සඳහා යොදා ගත් බව පැහැදිලිය. මෙහි අග්‍ර ඵලය නෙලාගත් ආගමික දර්ශනය වූයේ බුදු දහමයි. ඊට හේතු වන්නේ වර්තමානයේ ද මෙම ක්‍රම වේදය බෞද්ධ සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන නිසාය. එසේම මේ සඳහා යොදා ගැණුනු භාණක පරම්පරා ආරම්භ කරන ලද්දේ ද ඉතා ප්‍රයෝජනවත් කාර්යයක් සඳහාය. එකිනෙකාට වැඩ බෙදා දීමේ මෙම ක්‍රමය නොතිබුණි නම් සම්බුද්ධ පරිනිර්වාණයේ සිට වසර හාරසියයකට පසු ක්‍රි. පූ. පළමුවන සියවසේ වළගම්බා යුගයේ දී ලක්දිව ආලෝක විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තුරු බුද්ධ දේශනාව කටපාඩමින් ගෙන ඒමට හැකි නොවන්නේය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් අනතුරුව අනුරාධපුර, පොළොන්නරු හා අනෙකුත් රාජධානි සමයන්හි බුද්ධවචනය ආරක්ෂා කිරීම සඳහා විවිධ ක්‍රමවේද පවත්වා ඇත. සංගායනා පැවැත්වීම, සම්බුදු සසුනේ චිරස්ථිතිය සඳහා කතිකාවත් සකස් කිරීම ආදිය ඒ අතර ප්‍රමුඛ වේ. මින්පසු භාණක පරම්පරාව කවර කලෙක අභාවයට ගියේදැයි කිව නොහැකිය. එහෙත් වර්තමානයේ ද සම්බුදු සසුන තුළ වනපොත් කිරීම හෙවත් ධර්මය කටපාඩම්

කිරීම පවත්වාගෙන එනු ලබයි. වර්තමානයේ එය සමස්ත ත්‍රිපිටකය සඳහා ම අදාළ නොවේ. භික්ෂූන් වහන්සේ කෙනෙකුට විශේෂයෙන් දැනගතයුතු ධර්ම කොට්ඨාශ මෙසේ වනපොත් කරනු ලබයි.

ආන්තික සටහන්

[1] සොරත හිමි, වැලිවිටියේ, <u>ශ්‍රී සුමංගල ශබ්දකෝෂය,</u> අනුල යන්ත්‍රාලය, මරදාන, 1956, 858 පිටුව.

[2] නිකාය සංග්‍රහය, .............

[3] උපරතන හිමි, කොටියාගල, <u>බ්‍රාහ්මණ හා බෞද්ධ සමාජ දර්ශනය,</u> දයාවංශ ජයකොඩි හා සමාගම, කොළඹ, 2005, 55, 56 පිටුව.

[4] -එම-, 55 පිටුව.

[5] පේමරතන හිමි, රොටුඹ, <u>බුද්ධකාලීන භාරතීය ආගම්,</u> එඩ්නේ එන්ටප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්, ඊවන් මුද්‍රණය, පන්නිපිටිය, 1993, 20 පිටුව.

[6] -එම-, 1993, 33 පිටුව.

[7] ''එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං ධම්මකථිකානං යදිදං පුණ්ණො මන්තාණිපුත්තෝ'' <u>අංගුත්තර නිකාය 1,</u> එතදග්ග පාළි, බු. ජ. ත්‍රි. මු., සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005, 48 පිටුව.

[8] ''එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං විනයධරානං යදිදං උපාලි'' <u>අංගුත්තර නිකාය 1,</u> -එම-, 2005, 48 පිටුව.

[9] ''යෝ ඛෝ ආනන්ද, මයා ධම්මෝ ච විනයෝ ච දේසිතො පඤ්ඤත්තෝ. සෝ වෝ මමච්චයෙන සත්ථා'ති'' <u>දීඝනිකාය 11,</u> මහාවග්ග, මහාපරිනිබ්බාන සුත්තං, බු. ජ. ත්‍රි. මු., සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005, 242 පිටුව.

[10] පරිනිබ්බුතෙ භගවති යෙ තෙ තත්‍ථ භික්ඛූ අවීතරාගා අපෙපකෙචෙච බාහා පග්ගය්හ කන්‍දන්ති. ඡින්පාතං පපතන්ති. ආවට්ටන්ති විවට්ටන්ති, අතිඛිප්පං භගවා පරිනිබ්බුතො. අතිඛිප්පං සුගතො පරිනිබ්බුතො. අතිඛිප්පං චක්ඛුං ලොකෙ අන්තරහිතො'ති. යෙ පන තෙ භික්ඛූ වීතරාගා. තෙ සතා සම්පජානා අධිවාසෙන්ති.

දීඝනිකාය, මහාවග්ග, පරිනිබ්බාන සුත්තං, 248 පිටුව.

[11] ''අලං ආවුසො මා සෝචිත්ථ. මා පරිදේවිත්ථ. සුමුත්තා මයං තෙන මහා සමණෙන. උපද්දුතා ච මයං හෝම 'ඉදං වො කප්පති, ඉදං වො න කප්පතී'ති. ඉදානි මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම, යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාමා'ති,'' <u>චුල්ලවග්ග පාළි,</u> පඤ්චසතිකක්ඛන්ධකය, බු. ජ. ත්‍රි. මු., සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005, 544 පිටුව.

[12] ''හන්ද මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සංගායාම. පුරෙ අධම්මෝ දිප්පති ධම්මෝ පටිබාහියති. පුරෙ අවිනයෝ දිප්පති විනයෝ පටිබාහියති. පුරෙ අධම්මවාදිනො බලවන්තො හොන්ති ධම්මවාදිනො දුබ්බලා හොන්ති. පුරෙ අවිනයවාදිනො බලවන්තො හොන්ති විනයවාදිනො දුබ්බලා හොන්තී'ති'' <u>චුල්ලවග්ග පාළි,</u> -එම-, 2005, 544 පිටුව.

[13] ''එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං ආනන්දො. සතිමන්තානං... ගතිමන්තානං... ධිතිමන්තානං... උපට්ඨාකානං යදිදං ආනන්දො'' <u>අංගුත්තර නිකාය 1,</u> 2005, 48 පිටුව.

[14] <u>සුමංගලවිලාසිනි, නාම දීඝනිකායට්ඨකථා,</u> හේ. වි. මු., 12, 13 පිටු.

[15] විනයපිටකාවසානෙපි වුත්තනයෙනෙව පඨවිකම්පො අහොසි. තං ආයස්මන්තං උපාලි පටිච්ඡාපෙසුං. <u>සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා,</u> -එම-, 1929, 10 පිටුව.

[16] අයං දීඝනිකායො නාමා'ති වත්වා ආයස්මන්තං ආනන්දං පටිච්ඡාපෙසුං.

අසීතිභාණවාරපරිමාණං මජ්ඣිම නිකායං සංගායිත්වා ධම්මසෙනාපති සාරිපුත්තත්ථෙරස්ස නිස්සිතකෙ පටිච්ඡාපෙසුං.

භාණවාරසතපරිමාණං සංයුත්ත නිකායං සංගායිත්වා මහාකස්සපත්ථෙරං පටිච්ඡාපෙසුං.

වීසතිභාණවාරසතපරිමාණං අංගුත්තර නිකායං සංගායිත්වා අනුරුද්ධත්ථෙරං පටිච්ඡාපෙසුං.

<u>සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා,</u> -එම-, 1929, 11 පිටුව.

[17] පුබ්බේ කිර මහාථෙරා පරියත්ති අන්තරධානාය එකෙකස්ස ගණස්ස දීඝනිකායාදි එකෙකෙ ධම්මකොට්ඨාසෙ නීය්‍යාතෙන්තා ''තුම්හෙ එතං පාළිතො ච අට්ඨකථාතො ච පරිහරථ. සක්කොන්තා උත්තරිම්පි උග්ගණ්හථා'ති එවං සකල ධම්මං ගන්ථවසෙන නීය්‍යාතෙන්ති. තත්ථ තෙ ච භික්ඛූ ගන්ථ නාමෙන දීඝභාණකා මජ්ඣිම භාණකා, වොහරීයන්ති.

<u>විමතිවිනෝදනී ටීකාව</u>, හේ. වි. මු. 1935, 25 පිටුව.

[18] <u>මිලින්දපඤ්හ,</u> හේ. වි. මු. 1929, 342 පිටුව.

[19] ඉමං තන්තිං සංගායිත්වා බුද්දකගන්ථො නාම අයං'ති ච වත්වා අභිධම්ම පිටකස්මිංයෙව සංගහං ආරොපයිංසූ'ති දීඝභාණකා වදන්ති. <u>සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා,</u> -එම-, 1929, 11 පිටුව.

[20] මජ්ඣිමභාණකා පන ''චරියාපිටක අපදාන බුද්ධවංසෙහි සද්ධිං සබ්බම්පි තං බුද්දකගන්ථං සුත්තන්ත පිටකෙ පරියාපණ්ණන්ති වදන්ති. <u>සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා,</u> -එම-, 1929, 11 පිටුව.

[21] අත්ථසාලිනි, බාහිර නිදාන වණ්ණනා, හේ. වි. මු. 1981, 14 පිටුව.

[22] අභිධම්මෙ වාචනාමග්ගො පන සාරිපුත්තථෙරප්පභවො, අත්ථසාලිනී, -එම-, 1981, 14 පිටුව.

[23] අත්ථසාලිනී නාම, ධම්මසංගනීප්පකරණට්ඨකථා, හේ. වි. මු., 1940, 26 පිටුව.

[24] චුල්ලවග්ග පාළි 2, බු. ජ. මු., 2005, 566-599 පිටු.

[25] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, බාහිර වණ්ණනා, -එම-, 1929, 21 - 35 පිටු.

[26] _-එම-, 35 පිටුව.

[27] -එම-, 36 පිටුව.

[28] ඤාණකීර්ති හිමි, ගනේගම, ත්‍රිපිටක සාහිත්‍යයට පෙරවදනක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2006, 82 පිටුව.

[29] අථ මහින්දත්ථෙරො උපසම්පන්නකාලතොප්පභුති අත්තනො උපජ්ඣායස්සේව සන්තිකෙ ධම්මඤ්ච විනයඤ්ච පරියාපුණන්තෝ ද්වේපි සංගීතියො ආරුළ්හං තිපිටකසංගහිතං සාට්ඨකථං සබ්බං..... සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, බාහිර වණ්ණනා, -එම-, 1929, 29 පිටුව.

[30] ඌණපූරණ සහිතො මහාවංසො, (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 33 පරි. 62 ගා. 75 පිටුව

[31] ධම්මපදට්ඨකථා, ද්වේසහායක වත්ථු, හේ. වි. මු., 1981, 114 පිටුව.

[32] ඤාණකීර්ති හිමි, ගනේගම, -එම- 2006, 82 පිටුව.

[33] සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා, -එම-, 1929, 11 පිටුව.

[34] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, -එම-, 1929, 86 පිටුව.

[35] -එම-, 86 පිටුව.

[36] මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, තික නිපාත වණ්ණනා, හේ. වි. මු., 1929, 369 පිටුව.

[37] සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථා, -එම-, 1929, 386 පිටුව.

[38] සම්මාසම්බුද්ධො'ව පඨමතරං ආභිධම්මිකො. සො හි නං මහාබොධිපල්ලංකෙ නිසීදිත්වා පටිවිජ්ඣි. අත්ථසාලිනී ධම්මසංගනීප්පකරණට්ඨකථා, , හේ. වි. ම, 1940, 15 පිටුව.

[39] -එම- 25 පිටුව.

[40] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, තතිය පාරාජික වණ්ණනා, -එම-, 1929, 321 පිටුව.

[41] මිලින්දපඤ්හ, පුබ්බයොග 18 අංකය බලන්න

[42] මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, -එම-, 1929, 372 පිටුව.

[43] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, -එම-, හේ. වි. මු., 1929, 464 පිටුව.

[44] අදිකාම්, ඊ. ඩබ්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, දෙවන මුද්‍රණය එස් ගොඩගේ සහ සහෝදරයෝ මරදාන, 2003, 70 වෙනි පිටුවේ සිට ඉදිරියට.

[45] චන්දරතන හිමි, ලබුහේන්ගොඩ, පාලි අට්ඨකථා සාහිත්‍යය, මරදාන, 1968, 89 පිටුව.

[46] -එම-, 89 පිටුව.

[47] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, තිංසක වණ්ණනා, හේ. වි. මු., 1929, 464 පිටුව.

[48] අදිකාරම්, ඊ. ඩබ්., -එම-, 2003, 187 පිටුව.